සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2023-03-04
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, භූමිය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?

(1) ලාභය. (2) කුලිය. (3) පොලිය. (4) වේතන.

**1.2** අභිමතානුරූපී (normative) ආර්ථික ප්‍රකාශ සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

**(a)** එමගින් "යමක් සිදුවිය යුතු ආකාරය" සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම සිදු වේ.

**(b)** එය පුද්ගලානුබද්ධ වටිනාකම් විනිශ්චයන් මත පදනම් වේ.

**(c)** එය සැබෑ ලෝකයේ පවතින තොරතුරු සහ සංඛ්‍යා මගින් විමසා බැලිය හැකිය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ:

(1) **(a)** සහ **(b)** පමණි. (2) **(a)** සහ **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

**1.3** 2021 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව, 2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය වූයේ:

(1) 2.3%. (2) 3.1%. (3) 3.7%. (4) 4.5%.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථාවක් **නොවන්නේ** කුමක් ද?

(1) සම්පත්වල හිඟකමක් නොපවතින විට.

(2) නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් තිබෙන විට.

(3) සම්පත්වල විකල්ප ප්‍රයෝජන නොමැති විට.

(4) සේවා වියුක්ත සම්පත් ආර්ථික කටයුතු සඳහා භාවිත කරන විට.

**1.5** පහත ප්‍රකාශන සලකා බලන්න:

**(a)** ඉල්ලුම් ප්‍රමාණය, සැපයුම් ප්‍රමාණයට සමාන වීම.

**(b)** තරඟකාරී වෙළෙඳපොලක ගැනුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ අපේක්ෂාවන් ගැළපීම.

**(c)** අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් පැවතීම.

**(d)** මිල වෙනස්වීමේ ප්‍රවණතාවයක් නොමැති වීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳපොළ සමතුලිතය පිළිබඳ **වැරදි** ලෙස විස්තර කර ඇති ප්‍රකාශ / ප්‍රකාශය වන්නේ:

(1) **(c)** පමණි. (2) **(d)** පමණි.

(3) **(c)** සහ **(d)** පමණි. (4) **(b), (c)** සහ **(d)** පමණි.

**1.6** **Y** භාණ්ඩයේ මිල රු.75/- සිට රු.125/- දක්වා වැඩිවන විට, **X** භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය 4,000 සිට 2,500 දක්වා අඩුවේ. **X** සහ **Y** යනු අනුපූරක භාණ්ඩ නම්, **X** සහ **Y** භාණ්ඩවල හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය වනුයේ:

(1) 0.5625. (2) − 0.5625. (3) − 1.778. (4) 1.778.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, දේශීය වී ගොවීන් ආරක්ෂා කරන්නේ කුමන ක්‍රියාමාර්ගයෙන්ද?

(1) සහල් මත පනවන ලද උපරිම පාලන මිල. (2) වී මත පනවන ලද අවම පාලන මිල.

(3) වී නිෂ්පාදනය මත බදු පැනවීම. (4) ආනයනික සහල් වර්ග සඳහා සහනාධාර ලබාදීම.

**1.8** පහත සඳහන් ඒවා අතුරෙන්, වැඩිවන පරිමාණානුකූල ඵල හට ගැනීමට බලපාන සාධකයක් **නොවන්නේ** කුමක් ද?

(1) කළමනාකරණයේ ගැටළු.

(2) නිෂ්පාදන සාධකවල නොබෙදිය හැකි බව.

(3) ඉහළ තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර භාවිතය.

(4) එක් වරකදී පමණක් දැරිය යුතු වියදම් තිබීම.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරගකාරී වෙළෙඳපොළක නිරත ආයතනයක් සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) ඕනෑම ආයතනයකට ආර්ථික ලාභ ලබමින් වෙළෙඳපොළ තුළ රැඳී සිටිය හැකිවීම.

(2) එයට දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ ලැබිය හැකිය.

(3) වෙළෙඳපොළින් පිටවීමට බාධා පැවතීම.

(4) එය සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කරයි.

1.10 ව්‍යාපාර චක්‍රයෙහි පතුලේ සිට මුදුණත දක්වා වන කාල පරාසය හඳුන්වනු ලබන්නේ:

(1) අවපාත අවධිය. (2) ප්‍රසාරණ අවධිය. (3) ආර්ථික පරතරය. (4) නිමැවුම් පරතරය.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.11 X සහ Y භාණ්ඩයේ හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය ……………… *(ධන / සෘණ)* වේ නම්, එම භාණ්ඩ ආදේශක භාණ්ඩ ලෙස සළකනු ලැබේ.

1.12 ……………… *(ඒකාධිකාරී තරගකාරී / ඒකාධිකාරී)* ආයතනයක් විසින් දිගුකාලයේදී ප්‍රාමාණික ලාභ පමණක් ලබයි.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 මහජනතාව සතු ව්‍යවහාර මුදල් හා මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතුවල එකතුව පුළුල් මුදල් සැපයුම [Broad Money Supply ($M_2$)] ලෙස හැඳින්වේ.

1.14 සමාජය විසින් මුහුණදෙන මූලික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා පිහිටුවාගත් මූලධර්ම පද්ධතියක්, ආර්ථික පද්ධතියක් ලෙස හැඳින්වේ.

*අංක 1.15 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.15 "සූක්ෂ්ම ආර්ථික විද්‍යාව" (Micro Economics) සහ "සාර්ව ආර්ථික විද්‍යාව" (Macro Economics) අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

1.16 මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ඇති ප්‍රතිලෝම [inverse (negative)] සම්බන්ධතාවයට හේතුවන ආදායම් ප්‍රතිවිපාකය කෙටියෙන් පැහැදිලි කරන්න.

1.17 "තේරීම" සහ "ආවස්ථික පිරිවැය" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් දෙකක්(02) සඳහන් කරන්න.

1.19 උපේක්ෂා වක්‍රයක් (indifference curve) යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.20 "තිරසාර සංවර්ධනය (Sustainable Development)" යන පදය කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

<u>B කොටස</u>

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත දී ඇති ඉල්ලුම් [Demand (Qd)] ශ්‍රිතය සහ සැපයුම් [Supply (Qs)] ශ්‍රිතය සලකා බලන්න:

$$Qd = 17 - 0.05p$$

$$Qs = -1 + 0.1p$$

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 04)

(ii) රජය විසින් ඉහත භාණ්ඩයේ සැපයුම්කරුවන් මත රු.30/- ක ඒකක බද්දක් පනවන්නේ නම්, ඒකක බද්දෙන් පසු වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 03)

(b) පාරිභෝගික සමතුලිතය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) ආර්ථික භාණ්ඩ (Economic Goods) සහ ආර්ථික නොවන භාණ්ඩ (Non-Economic Goods) අතර වෙනස එකිනෙකට උදාහරණයක් බැගින් දෙමින් **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) පහත සඳහන් තොරතුරු භාවිතයෙන් සාමාන්‍ය විචල්‍ය පිරිවැය [Average Variable Cost (AVC)] **ගණනය කරන්න**:

| ප්‍රමාණය | මුළු විචල්‍ය පිරිවැය (TVC) | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) |
|---|---|---|
| 1 | 150 | |
| 2 | 250 | |
| 3 | 330 | |

(ලකුණු 03)

(c) ආන්තික පිරිවැය [Marginal Cost (MC)] සහ ආන්තික ආදායම [Marginal Revenue (MR)] අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) විද්‍යුත් මුදල් (electronic money) භාවිතය සඳහා හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) "2022 මුල් මාසයන්හිදී, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් [Standard & Poor's (S&P)] විසින් ශ්‍රී ලංකාවේ දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීම, 'CCC+' සිට 'CCC' දක්වා පහත දමන ලදී".

**ඔබ විසින් කළ යුතු දෑ:**

ණය ශ්‍රේණිගත කිරීම පහත දැමීමට මූලික වූ හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ශ්‍රී ලංකාවේ පවතින අධි උද්ධමනකාරී තත්ත්වය හේතුකොටගෙන පාරිභෝගිකයින් හට ඇතිවන ප්‍රතිවිපාක තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) ඩොලර් ඉල්ලුම් කිරීමට හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) **A** රට සහ **B** රට විසින් **X** සහ **Y** යන නිෂ්පාදිත දෙවර්ගයම නිෂ්පාදනය කරයි. රටවල් දෙක විසින් එක් ශ්‍රම ඒකකයක් භාවිතයෙන් නිපදවනු ලබන **X** සහ **Y** යන ඒකක ප්‍රමාණයන් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

| නිෂ්පාදිතය / රට | X (ඒකක) | Y (ඒකක) |
|---|---|---|
| **A** | 8 | 4 |
| **B** | 3 | 6 |

(i) එක් එක් නිෂ්පාදිතය, නිෂ්පාදනය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසියක් ඇත්තේ කුමන රටටද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) එක් එක් භාණ්ඩය නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් ඇත්තේ කුමන රටටද යන්න **පැහැදිලි කරන්න** *(ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).* (ලකුණු 04)

(c) ගෙවුම් ශේෂ ලේඛණය තුළ ඇතුළත් කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) වසරක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාලව පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබා දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 2,500 |
| රජයේ පරිභෝජන වියදම | 5,000 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 4,500 |
| තොග වෙනස්වීම් | 2,456 |
| අපනයන | 2,800 |
| ආනයන | 5,789 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | -50 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(i) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 05)

(ii) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(iii) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(b) ජාතික ආදායම් ගිණුම්කරණයේ මූලික මිල යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**.
(ලකුණු 02)

(B) රටක ආර්ථිකයක් කළමනාකරණය කිරීමේදී භාවිත කරනු ලබන ප්‍රතිපත්ති සහ උපායමාර්ග සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ලෙස සැලකේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(C) (a) රජයේ පුනරාවර්තන වියදම් (recurrent expenditure) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) ප්‍රධාන පුනරාවර්තන වියදම් වර්ග දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)
(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තිරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |